ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## ජ්‍යෝතිෂය උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර) - 05 කණ්ඩායම

## අයදුම්පත් කැඳවීම

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | : | මාස 08 කි. |
| SLQF ස්තරය | : | 02 වන ස්තරය (Level 02) |
| ඉගැන්වීම් මාධ්‍යය | : | සිංහල |
| අවම සුදුසුකම් | : | 1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය (විෂයන් හයක් සම්මාන තුනක් සහිතව) සමත් වීම.<br>**හෝ**<br>2. මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම.<br>**හෝ**<br>3. ධර්මාචාර්ය විභාගය සමත්වීම.<br>**හෝ**<br>4. පිළිගත් අධ්‍යාපන ආයතනයකින් ජ්‍යෝතිෂය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් (SLQF-01) හදාරා සමත් වීම.<br>**හෝ**<br>5. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම. |
| පාඨමාලා ගාස්තුව | : | අයදුම්පත් ගාස්තුව - රු. 500.00<br>පාඨමාලා ගාස්තුව - රු. 25,000.00<br>(පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. පළමු වාරිකය රු. 18,000/-කි. එය ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු අතර ඉතිරි මුදල පාඨමාලාව ආරම්භ වී මාස දෙකක් ඇතුළත ගෙවිය යුතුය.) |

- මෙම පාඨමාලාව සඳහා ඉහත දක්වා ඇති අදාළ සුදුසුකම් සපුරන ගිහි/පැවිදි/ස්ත්‍රී/පුරුෂ ඕනෑම අයෙකුට ඉල්ලුම් කළ හැකිය.
- පාඨමාලාව සඳහා **මාර්ගගත ක්‍රමයට (Online) හෝ සම්මුඛ ක්‍රමයට** සම්බන්ධ විය හැකිය.
- පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය පිරිසක් අයදුම්කර තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගැනීම 2024.06.30 අවසන් වේ.

**පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම**

1. විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියට (www.busl.ac.lk) පිවිස මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම් කළ යුතුය.
2. පියවර 01 යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/PZPtmR13BuCUWHpG8 ක්ලික් (Click) කර අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යොමු අංකයක් (Reference Number) ලබා ගත යුතුය.
3. ඉන් පසු ලබා දී ඇති ආකෘතිය අනුව යොමු අංකය (Reference Number) නිවැරදිව සඳහන් කර දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක 008-1001-7001-4461 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව බැර කළ යුතුය.
4. අයදුම්පත පිරවීමට පෙර උපදෙස් හොඳින් කියවා පහත ලියකියවිලිවල පරිලෝකන පිටපත් (Scan Copy) ලබා ගැනීම සිදු කළ යුතු අතර ඒවා pdf ආකෘතියට තිබිය යුතුය.
   - උප්පැන්න සහතිකය
   - පැවිදි අයදුම්කරුවන් සඳහා සාමණේර/උපසම්පදා සහතිකය
   - ජාතික හැඳුනුම්පත
   - අධ්‍යාපන සහතික
   - අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපත
5. ඉහත කී සියලුම ලියකියවිලි සකස් කරගත් පසු **පියවර 02** යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/ke7nE1pMAe1BocoF7 ක්ලික් (Click) කර ගූගල් ෆෝරමයේ ඇති ප්‍රශ්නවලට නිවැරදි තොරතුරු ඉදිරිපත් කර 2024.06.30 දින දක්වා අයදුම්පත් යොමු කළ හැකිය.

වැඩි විස්තර - පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
025 205 7978
071 627 6469 (WhatsApp only)
විශ්වවිද්‍යාල වෙබ් අඩවිය - www.busl.ac.lk

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය.